රුහුණ විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි - 4000 ස්ථලය
දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි

SLS 4205 – සිංහල සංස්කෘතිය

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

කාලය : පැය 03

---

01. කිසියම් සංස්කෘතියක් වෙනස්වීම කෙරෙහි සංස්කෘතික සංඝටනය බලපාන ආකාරය නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

02. මහින්දාගමනයත් සමඟ පැරණි ශ්‍රී ලංකාවේ පැවති සමාජ සම්භාවිතා 'බෞද්ධ' ස්වරූපයකට නැඹුරු වූ ආකාරය සමීක්ෂා කරන්න.

03. ගොවිතැන හා ආගමික සංකල්ප අතර පවතින සම්බන්ධතාව ගොවිජන ජීවිතය තුළ පිළිබිඹු වන ආකාරය පිරික්සන්න.

04. ධීවර වෘත්තිය සහ ආගමික ප්‍රතිවිරුද්ධතාව ඔබ විවරණය කරන්නේ කෙසේ දැ යි උදාහරණ දක්වමින් පරීක්ෂා කරන්න.

05. ශ්‍රී ලංකාව තුළ බුදු දහමේ තහවුරු වීමත් සමඟ ලාංකේය අධ්‍යාපන රටාවේ සිදු වූ පරිවර්තනීය තත්ව විභාග කරන්න.

06. රජු වනාහි අසහාය බලයකින් හා අසීමිත ආඥාදායකත්වයකින් හෙබි පාලකයෙක් දැ යි ලාංකේය රාජ්‍ය ඉතිහාසය ඇසුරින් පිරික්සන්න.

07. අතීත ලංකාවේ භාවිත වූ මුදල් ව්‍යවහාර ක්‍රම ඇසුරු කොට ගෙන තත්කාලීන සමාජ තත්වය පිළිබඳ විමර්ශනයක් කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට (02) කෙටි සටහන් ලියන්න.

   i. ලංකාවේ නාග විශ්වාස
   ii. කුල ක්‍රමයෙහි නෂ්ටාවශේෂ
   iii. අතීත ලංකාවේ වාපී සංස්කෘතිය

(සෑම පිළිතුරකට ම ලකුණු 16 බැගිනි.)

@@@@@@@